**ආචාර්ය අචලා අත්තනායක**
නියෝජ්‍ය අධ්‍යක්ෂ,
රාජකීය උද්භිද උද්‍යානය, පේරාදෙණිය.

# උද්භිද උද්‍යාන හා ශාක විතැන් සංරක්ෂණය

ජෛව විවිධත්වය යනු මිහි මත වෙසෙන සියළු ජීවීන්ගේ විවිධත්වයේ එකතුවකි. එනම් පෘථිවියේ වෙසෙන සියළු ජීවී විශේෂ මෙන්ම එම විශේෂවල ජාන හා එම විශේෂ එක්ව වාසය කරන පරිසර පද්ධතීන්ගේ විවිධත්වය යන සියල්ලද ඇතුළත්වය. ජෛව විවිධත්වය පරිසරයේ සෞන්දර්යාත්මක වටිනාකම මෙන්ම ස්වාභාවික පරිසරයේ අඛණ්ඩතාව පවත්වා ගැනීම සඳහා මූලික කාර්යභාරයක් ඉටු කරන අතර, සියළු ශාක හා සතුන් ඇතුළු ජීවීන්ගේ සමස්ත යහපැවැත්ම සහතික කරයි. මෙහිදී විශේෂයෙන්ම ජෛව විවිධත්වය මඟින් මිනිසුන්ට ආහාර, ඇඳුම්, ඖෂධ, ඉන්ධන හා වාසස්ථාන ඇතුළු සියළු සම්පත් ලැබේ. ලොව ජීවී විශේෂ අතුරින් ශාක හා සතුන් මිලියන 8.7ක් පමණ වන බවට මේ වන විට උපකල්පනය කර ඇති අතර මේ වන විට ඉන් මිලියන 1.2ක් පමණ දැනට හඳුනා ගෙන ඇති බවට National Geographic වෙබ් අඩවිය වාර්තා කරයි. මෙම ජීවී කාණ්ඩ අතුරින් වඩාත් වැදගත් කාණ්ඩයක් ලෙස ශාක සැලකිය හැකිය.

ලොව ජෛව විවිධත්වය හායනයට ලක් වීම හා එමඟින් අනාගතයේ මිනිසාගේ මෙන්ම සියළු ජීවීන්ගේ පැවැත්මට බලපෑම් ඇතිවීම නිරතුරු සාකච්ඡාවට ගැනෙන මාතෘකාවක් බවට මේ වන විට පත්ව ඇති බව කාටත් නොරහසකි. කෙසේ වුවද, පෘථිවියේ ජෛව විවිධත්වයෙන් වැඩි ප්‍රමාණයක් අවදානමට ලක්ව ඇත්තේ මිනිස් පරිභෝජනය ඇතුළු පරිසර පද්ධතීන්ගේ පැවැත්මට බාධා කරන මෙන්ම ඒවා විනාශ කරන අනෙකුත් මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙනි. එමෙන්ම පරිසර දූෂණය, දේශගුණික විපර්යාස සහ ජනගහන වර්ධනය යන සියල්ලම ජෛව විවිධත්වයට තර්ජනයක් වී ඇති ප්‍රධාන හේතූන් බවද සඳහන් කළ හැකිය. මෙම තර්ජන නිසා විශේෂ වඳවීමේ වේගය පෙර නොවූ විරූ ලෙස ඉහළ ගොස් ඇති බව පෙනී යයි. පෘථිවියේ ඇති සියලුම ජීවීන්ගෙන් අඩක් ඊළඟ සියවස තුළ මිහි මතින් අතුරුදන් වීමට ඉඩ ඇති බවටත්, ලොව මහා වඳ වී යාමක එළිපත්ත මත හිඳින බවටත් ඇතැම් විද්‍යාඥයන් මෑතක දී පුරෝකථනය කර ඇත.

එබැවින් ජෛව විවිධත්වය ආරක්ෂා කිරීමට සහ වඳවීමේ තර්ජනයට ලක්ව ඇති විශේෂ හා ඒවායේ වාසස්ථාන ආරක්ෂා කිරීමට කටයුතු කිරීම මිනිසාගේ මෙන්ම සියළු ජීවීන්ගේ පැවැත්ම උදෙසා ඉතා වැදගත්වේ. ජෛව විවිධත්වය සුරැකීමේ අවශ්‍යතාවය නිතර කථිකාවට බඳුන්වන මාතෘකාවක් බවට මේ දිනවල විශේෂ අවධානයට ලක්ව ඇත්තේ ඒ හේතුවෙනි.

ලොව සංරක්ෂණ කාර්යභාරය ආකාර දෙකකින් ඉටු කරනු ලැබේ. එනම් ස්ථානීය සංරක්ෂණය ලෙස ගැනෙන ජීවීන් ස්වභාවිකව වාසය කරන පරිසරයන්හිදීම එම ජීවීන් ආරක්ෂා කිරීම හා විතැන් සංරක්ෂණය ලෙස ගැනෙන ජීවීන් ඉන් පිටත ස්ථානවල සුදුසු තත්ව යටතේ සංරක්ෂණය කිරීම යන දෙආකාරයයි. ශ්‍රී ලංකාවේ ශාක විතැන් සංරක්ෂණ කාර්යභාරය

ප්‍රමුඛව පැවරී ඇති ප්‍රධාන ආයතනය වන්නේ උද්භිද උද්‍යානයන්ය. එලදායී ලෙස ශාක විශේෂ සංරක්ෂණය සඳහා වඩාත් සැලසුම් සහගත සංරක්ෂණ උත්සහයන් අවශ්‍ය වේ.

ශාක විශේෂ බොහෝ හේතු නිසා වඳවීමේ තර්ජනයට මුහුණ දී ඇති බැවින් උද්භිද උද්‍යාන මඟින් ශාක විශේෂ සංරක්ෂණය කිරීමේ ක්‍රියාකාරකම් ලෙස තර්ජනයට ලක් වූ ශාක සඳහා ශ්‍රී ලංකා ශාක ප්‍රජාව ගවේෂණය කර සංරක්ෂණය කළ යුතු දුර්ලභ ශාක විශේෂ එකතු කර, උද්‍යාන තවාන්වල නඩත්තු කර, උද්‍යාන ශාක එකතුවට එක් කර සංරක්ෂණය කිරීමත්, ඊට අමතරව ස්ථානීය සංරක්ෂණය බල ගැන්වීමේ අරමුණින් ශාක විශේෂ නැවත ස්වභාවික වාසස්ථාන වලට හඳුන්වාදීමත් එනම් එම විශේෂ යථා තත්ත්වයට පත් කිරීම සඳහා සංරක්ෂණ පියවරක් ලෙස ප්‍රතිස්ථාපන කාර්යභාරයත් එයට ඇතුළත් වේ. මෙතැන් සිට මා විස්තර කිරීමට බලාපොරොත්තු වන්නේ උද්භිද උද්‍යාන විසින් ඉටු කරන මෙම කාර්යභාරයන්ය.

උද්භිද උද්‍යානයක් ලෙස හඳුන්වන්නේ විද්‍යාත්මක, අධ්‍යාපනික, පර්යේෂණ, සංරක්ෂණ කටයුතු හා ප්‍රදර්ශනය සඳහා සවිස්තරාත්මකව ලේඛණගත කර සකස් කර ගන්නා ලද ජීවී ශාක එකතුවක් පවත්වා ගැනීමයි.

ශ්‍රී ලංකාවේ 2012 වසරේ ජාතික රතු දත්ත ලැයිස්තුවට අනුව උද්‍යානය තුළ පවතින වඳවී යාමේ තර්ජනයට ලක්වූ ශාක ලෙස සඳහන් පණු කරඳ හෙවත් Crudia zeylanica (*Fabaceae*) ඇතුළු ශාක ගණනාවක් මෙලෙස උද්‍යානයේ ශාක එකතූන්ට මේ වන විට එකතු කර ඇත. මීට අමතරව රතු දත්ත ලැයිස්තු ගත අනෙකුත් ආවේනික ශාක ගණනාවක්ම අනාදිමත් කාලයක සිට උද්‍යාන එකතුවේ පවතින්නේ පෙර කරන ලද ශාක ගවේශණයන්හි ප්‍රතිඵලයන් ලෙසය. උදාහරණ ලෙස, Alphonsea hortensis (*Annonaceae*), පිණි බෙරලිය හෙවත් Doona ovalifolia (*Dipterocarpaceae*), කළු කැන්ද හෙවත් Diospyros atrata (*Ebenaceae*), මහකුරටිය හෙවත් Memecylon macrocarpum (*Melastomataceae*), Sophora violacea (*Fabaceae*) හා සුවඳ හෙවත් Mesua stylosa (*Clusiaceae*) යන ශාක විශේෂයෙන් සඳහන් කළ හැකිය.

මෑතකදී කරන ලද විශේෂිත පර්යේෂණ කටයුතු අතුරින් ශාක ප්‍රතිස්ථාපනය අරමුණු කර ගත් පර්යේෂණයන් කිහිපයක්ම වේ.

පිනි බෙරලිය ශාකය හා Alphonsea hortensis යන ඒක දේශික ශාක ස්වාභාවික වනාන්තර වලින් මෑත කාලයේ හමු වී ඇති බවට වාර්තා වී නොමැති වූ බැවින් ස්වභාවික පරිසරයෙන් වඳ වී ඇති (Extinct in the Wild - EW) කාණ්ඩයට 2012 ජාතික රතු දත්ත ලැයිස්තුව අනුව වර්ග කර තිබුනි. ඒවායේ ව්‍යාප්තිය වැඩි කර මෙම විශේෂය ප්‍රතිස්ථාපනය කිරීම සඳහා සූදානම් කිරීමට මෑතකදී දියත් කළ පර්යේෂණ මඟින් හැකියාව ලැබී ඇත.

Alphonsea hortensis වැඩුනු ශාක 6 ක් උද්‍යානය තුළ පමණක් ඇති අතර ඉන් හට ගන්නා ලද ඵලවල බීජ රෝපණය කිරීමෙන් පැළ විශාල ප්‍රමාණයක් බෝ කරන ලදී. පසුව පැවැති පර්යේෂණයක් මඟින් මේවා හඳුන්වා දීමට වඩාත් සුදුසු ප්‍රදේශ හඳුනා ගැනීමට කටයුතු කරන ලදී. එමඟින් මෙයින් ස්ථානීය සංරක්ෂණය බල ගැන්වීම සඳහා නැවත ස්වභාවික වාසස්ථාන

වලට හඳුන්වා දීමද, විතැන් සංරක්ෂණය ඉටු කිරීමට වෙනත් ස්ථානවලට හඳුන්වා දීමද ඉදිරියේදී අවසන් කිරීමට මේ වන විට සැළසුම් කර ඇත. තවද මෙම ප්‍රයත්නයේදී, අයහපත් කාළගුණික තත්වය මත ඉදිරි වැටුනු උද්‍යානයේ පැවැති එකම පිනි බෙරලිය ශාකය නැවත කේබල් යොදා නඟා සිටුවා සංරක්ෂණය කරනු ලැබීමෙන් පසු එහි රිකිළි මඟින් පැළ බෝ කර ගැනීමට කටයුතු යොදා සාර්ථකව පැළ කීපයක් පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේද සීතාවක තෙත් කළාපීය උද්භිද උද්‍යානයේද සිටුවන ලදී. නමුත් මේ වන විට එම විශේෂය නැවත ස්වාභාවික පරිසරයෙන් වාර්තා වී ඇති බැවින් එම ගහනයෙන්ද ගත් පැළ බෝ කිරීමටද කටයුතු කරමින් පවතී. ඉදිරි කාලය තුළ මේවායින් පැළ බෝ කර මෙහි ගහනය වැඩි කර මෙම විශේෂයේ ව්‍යාප්තිය වැඩි කිරීමට කටයුතු යොදා ඇත.

තවත් සංරක්ෂණ පර්යේෂණයක් මඟින් මධ්‍යම අධි වේගී මාර්ගය ඉදි වීමේදී තර්ජනයට ලක් විය හැකි වඳවී යාමේ දැඩි තර්ජනයට ලක් වූ ආවේණික විශේෂ වන Wrightia puberula (*Apocynaceae*) හා Combretum acuminatum (*Combretaceae*) මෙන්ම වඳවී යාමේ තර්ජනයට ලක් වූ ආවේණික හොර කුලයේ (*Dipterocarpaceae*) ශාකයක් වන Vatica paludosa යන විශේෂ සංරක්ෂණය කිරීම සඳහා උද්‍යානයට පැළ ගෙනැවිත් තවානේ නඩත්තු කර, සිටුවා ඇති අතර එම විශේෂ උද්‍යාන එකතුවට පසුව එක් කර ඇත. එමඟින් ඉඩ සැලසෙන ලෙස සුදුසු පරිසරවලට අනාගතයේදී නැවත හඳුන්වා දීමට අවස්ථාව සැලසේ. මෙම පර්යේෂණ කටයුතු මධ්‍යයේ හඳුනා ගත් රනිල කුලයේ (*Fabaceae*) ශාකයක් වන Crudia zeylanica ශාක විශේෂය රතු දත්ත ලැයිස්තුගතව තිබුනේ වඳ වූ (*Extinct - EX*) විශේෂයක් ලෙසිනි. මෙම විශේෂය 2019 වසරේදී උද්‍යානයට හඳුන්වා දෙන ලදී. තවද එම විශේෂයෙහි ව්‍යාප්තියද පර්යේෂණ කටයුතු හරහා සොයා ගන්නා ලද බැවින්, එය රතු දත්ත ලැයිස්තුවේ තර්ජනය අඩු කාණ්ඩයක් ලෙස ඉදිරියේදී ලැයිස්තුගත වීමට කටයුතු සැලසී ඇති බවද පෙනී යයි.

ඊට අමතරව උද්‍යානය ආරම්භයේ සිට එමඟින් සෑහෙන කලක් තුළ මෙවන් සංරක්ෂණ කටයුතු ඉටු කර ඇත. රතු දත්තගත ශාක අතරින් ඒක දේශීය කළු කැන්ද ශාකය ඉතා දුර්ලභව පැවැති කාලයේ උද්‍යානයේ සංරක්ෂණය කර ඇති මව් ශාකයෙන් බෝ කර ගත් පැළ 1982 වසරේ සිට උද්‍යානයේ හා දිවයිනේ බෝහෝ ප්‍රදේශවලට ව්‍යාප්ත කිරීම මගින් සංරක්ෂණ කාර්යාවලියට උද්‍යානය දායක වී ඇත. තවද කළුතර වතුරානෙන් පමණක් මේ දක්වා හමුව ඇති සුවඳ ගසෙහි විශාල මව් ශාක 3ක් පමණ උද්‍යානයේ සංරක්ෂණය කර ඇති අතර ඒවායින් ලද බීජවලින් සාදාගත් පැළ උද්‍යානය තුළ මෙන්ම දිවයිනේ වෙනත් ස්ථානවලටද ව්‍යාප්ත කර ඇත. මෙම අවස්ථා උද්‍යානයේ ශාක ප්‍රතිස්ථාපන ක්‍රියාවලියේ තවත් සන්ධිස්ථානයන් ලෙස දැක්විය හැකිය. උද්‍යානයේ දැනට ඇති මහ කුරටිය ගසෙන් ලබා ගත් බීජ මඟින් මෙන්ම පටක රෝපණ තාක්ෂණය භාවිතයෙන් පැළ සාදා ගැනීමට හැකිවී තිබීමද විශේෂිතය. ස්වාභාවික වනාන්තරවලින් අවසන් වරට මෙය වාර්තා වී ඇත්තේ 2005 වසරේදී කන්නෙලියෙන් හා බදුල්ලෙනි. ඉන් පෙර, මෙය ස්වභාවික පරිසරයේ තව දුරටත් හමු නොවන (EW) ලෙස සැලකූ විශේෂයකි. ස්වාභාවික පරිසරයේ දැනට දක්නට නොමැති අලංකාර මල් සහිත පඳුරක් වන Sophora violacea ද උද්භිද උද්‍යානය තුළ සංරක්ෂණය කර ඇති අතර එම ශාකය භූ නිර්මාණ කරනයේදී යොදා ගැනීමට ඇති හැකියාව පිළිබඳව මහජනයා දැනුවත් කිරීම මඟින් මෙය ව්‍යාප්ත කර සංරක්ෂණ ක්‍රියාවලියට දායක වීමටද හැකිව ඇත.

මීට අමතරව ශ්‍රී ලංකාවෙන් වඳ වී ගොස් ඇති ශාක ලෙස ප්‍රචලිතව තිබුනු මිදි කුලයේ (Vitaceae) ශාක විශේෂ කීපයක්ම ඒවායේ ස්වභාවික වාසස්ථානවල තිබී මෑත කාලයේදී සොයා ගත් පසු, එයට සමගාමීව එම ආවේණික විශේෂ වන Rinorea decora 2017 වසරේදී ද, Rinorea benghalensis හා රනිල කුලයේ (Fabaceae) ශාකයක් වන Crudia zeylanica 2019 වසරේදීද උද්‍යානයට හඳුන්වා දී ඇත.

පේරාදෙණිය උද්භිද උද්‍යානය තුළ ශාක සංරක්ෂණ කටයුතු ක්‍රියාත්මක කිරීමේදී සමහර දුර්ලභ ගනයේ ශාක විශේෂ නියෝජනය වන්නේ ඉතාමත් අඩු ශාක සංඛ්‍යාවකින් වන බැවින් හා සමහර ශාක උද්‍යානයේ නොමැති බැවින් ශාක සංරක්ෂණය බල ගැන්වීම උදෙසා උද්භිද විද්‍යා සමීක්ෂණ කටයුතු 2012 වසරේ ජාතික ශාකාගාරයේ මූලිකත්වයෙන් ආරම්භ කරන ලදී. මෙමඟින් 2012 වසරේ ප්‍රකාශයට පත් වූ ජාතික රතු දත්ත ලැයිස්තුවට ඇතුලත් වී ඇති වඳවී යාමේ තර්ජනයට ලක් වූ ශාක සොයා ඒවා උද්‍යානය තුළ සිටුවා සංරක්ෂණය කිරීමට කටයුතු කරමින් පවතී. මෙම ක්‍රියාවලිය ඔස්සේ එම ශාක මින් පෙර හමු වූ විවිධ ස්වභාවික පරිසර ගවේශණය කිරීම මඟින් සොයා ගනු ලබයි. එම ශාක ලේඛණගත කර දත්ත සටහන් කර ගැනීම මෙහිදී අතිශයින් වැදගත්වේ. ඉන් පසු මෙවන් ශාකවල ප්‍රරෝහණ ද්‍රව්‍ය වන බීජ, පැළ, අල හා ඒවායේ අතු උද්‍යානය වෙත ගෙනැවිත් ප්‍රරෝහනය කරනු ලැබේ. එමඟින් සාදා ගන්නා පැළ අවශ්‍ය පමණට වර්ධනය වූ පසු ඒවා ක්ෂේත්‍රයේ සිටුවා සංරක්ෂණය කරනු ලැබේ. එයට අමතරව අනාගතයේදී එම විශේෂවල පැවැත්මට ඇති විය හැකි උවදුරුවලින් ගලවා ගෙන මෙම ශාක ඉදිරි පරපුර සඳහා සංරක්ෂණය කිරීමට මේවා තව දුරටත් ව්‍යාප්ත කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ.

උද්භිද උද්‍යානයක ශාක සංරක්ෂණ කාර්යාවලියේදී එම ශාක යම් කිසි විද්‍යාත්මක පිළිවෙලකට රෝපණය කර ප්‍රදර්ශණය කරනු ලැබේ. බොහෝ උද්භිද උද්‍යාන මෙහිදී වර්ගීකරණ කාණ්ඩ අනුව වෙන්කර ගත් ශාක එකතූන්ට ශාක ගොනු කර වර්ධනය කරයි. පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයද මෙලෙස ශාක එකතූන්ට ශාක ගොනු කර වවන ලද ස්ථානයකි.

එම අරමුණු පෙරදැරිව ක්‍රියා කරන රාජකීය උද්භිද උද්‍යානයේ ශාක එකතූන් අතර ප්‍රධාන ශාක එකතුව වන්නේ හෙක්ටයාර 20ක භූමි භාගයක පැතිර ඇති රුක් උයනයි. මෙහි විවිධ ශාක කුලවලට අයත් ශාක විධිමත් ලෙස එක් එක් කොටස් වල සිටුවා තිබේ. දැනට මෙලෙස සංරක්ෂිතව ඇති පඳුරු හා ගස් 8000 ක් පමණ වන අතර එහි ශාක විශේෂ 1200කට වැඩි ප්‍රමාණයක් පවතී. ඉන් 50% පමණ දේශීය ශාකවලින් සමන්විත වන අතර ඉතිරි 50% විදේශීය ශාක වේ. වනෝද්‍යානය තුළ ශාක අධ්‍යයනය කරන්නන්ගේ පහසුව වෙනුවෙන් ලංකාවට අවේණික ශාක සඳහා රතු පසුබිම සහිත ලේබල්ද, දේශිය ශාක සඳහා කොළ පසුබිම සහිත ලේබල්ද, විදේශිය ශාක සඳහා කලු පසුබිම සහිත ලේබල්ද, විෂ සහිත ශාක සඳහා කහ පසුබිම සහිත ලේබල්ද, නිජබිම හඳුනා නොගත් ශාක සඳහා නිල් පසුබිම සහිත ලේබල්ද යොදා ඇත. ශාක කුල අනුව ශාක ගොනු කර ඇති බැවින් රුක් උයන නැරඹීමට පැමිණෙන මහජනතාවට හා සිසුන්ට විවිධ ශාක පිළිබඳව අධ්‍යනය කිරීම සඳහා එකම ශාක කුලයකට අයත් ශාකවල සමානකම් හා එකම කුලයේ විවිධ විශේෂ අතර ඇති වෙනස්කම් පිළිබඳව මනාව අධ්‍යයනය කිරීමට මෙමඟින් ඉඩ සළසා ඇත.

රුක් උයනේ සිටුවා ඇති සමහර ශාක ඉතාමත් පැරණි ඒවා වන අතර, ඒවා උද්‍යානය ආරම්භයට  කාලයකට පෙර සිට පැවත එන ඒවා වේ. එමෙන්ම උද්‍යානය ආරම්භ කරන කාලයේ සිට මේ දක්වා සිටුවන ලද ශාක ද වේ. ශ්‍රී ලංකාවේ වනාන්තර ගවේෂණය කිරීම මඟින් සොයා ගත් දේශීය ශාක ඉන් පසු සංරක්ෂණය සඳහා උද්‍යානයේ රෝපණය කරන ලද ඒවා වේ. මෙහි ඇති විදේශීය ශාක, බීජ හෝ පැළ විදේශ රටවලින් මෙම රටේ සිටුවීමට ගෙන්වා යෝග්‍ය බව පරීක්ෂා කිරීමට හා ආර්ථික වැදගත්කම පරීක්ෂා කිරීමට සිටුවා ඇත.

රුක් උයනේ පවතින සමහර විදේශීය මෙන්ම දේශීය ශාක එහි මව් පරිසරයේ හැරුණු විට දක්නට ලැබෙනුයේ මෙම උද්‍යානයේ පමණක් වීම මෙන්ම, ශ්‍රී ලංකාවට ආවේණික සමහර ශාකවල අවසන් නවාතැන වන්නේද පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය වීමද සුවිශේෂී වේ.

පුවක් කුලයට (Arecaceae) අයත් ශාකවලින් සුසැදි තාල ශාක එකතුවද උද්‍යානයේ ඉතා සුවිශේෂී එකතුවක් ලෙස සැලකේ. එසේ වන්නේ මෙම එකතුව ආසියාවේ ඇති විශාලතම තාල ශාක එකතුවලින් එකක් වන නිසා වන අතර, විශේෂ 200 ට වැඩි ප්‍රමාණයක් එහි තිබේ. මෙහි ඉඳි විශේෂ ගණනාවක්  (Phoenix spp.) හා ශ්‍රී ලංකාවට ආවේණික දුර්ලභ ශාක වන Calamus zeylanicus (තම්බොටු වැල්), Loxococcus rupicola (රන් දෝතළු) හා Oncosperma fasciculatum (කටු කිතුල්) වැනි ශාක ඇත. උද්‍යානයේ සංරක්ෂණය කර ඇති රන් දෝතළු ගස් කිහිපයෙන් ලබා ගන්නා ලද බීජ මඟින් සාදා ගන්නා ලද පැළ උද්‍යානය තුළ ශාක එකතුවේ මෙන්ම අලංකාරය සඳහාද සිටුවා ඇත. එබැවින් මෙය භූ නිර්මාණ කරනයේදී යොදා ගැනීමට ඇති හැකියාව පිළිබඳව මහජනයා දැනුවත් කිරීමටත් එලෙස මෙය ව්‍යාප්ත කර සංරක්ෂණ ක්‍රියාවලියට දායක වීමටත් හැකිවී ඇත. මෙම එකතුවට ආභරණයක් වන්නේ උද්‍යානයේ ප්‍රවේශ මාවත දෙපස ඇති දෙබිඩි පොල් මාවතයි. ලොව තර්ජනයට ලක් වූ විශේෂයක් ලෙස වාර්තාගතව ඇති දෙබිඩි පොල් (Lodoicea maldivica) එය ආවේණික වන සී ෂෙල්ස්හි පිහිටි විශාල එකතුවට පමණක් දෙවැනි වන බැවින් එය සුවිශේෂී වේ.




රන් දෝතළු



රන් දෝතළු මල

ලෝකයේ කුල 400 කට ආසන්න ප්‍රමාණයකට අයත් වන සපුෂ්ප ශාක 250,000 ක් පමණ දැනට වාර්තාගතවී ඇත. ශ්‍රී ලංකාවේ දේශිය සපුෂ්ප ශාක 3154 ක් පමණ වාර්තාවී ඇති අතර, ඒවා ශාක කුල 216 කට පමණ අයත්වේ. උද්‍යානයේ ශිෂ්‍ය උයනේ මින් ශාක කුල 85ක් පමණ නියෝජනය කරන විශේෂ 350 කට අධික සංඛ්‍යාවක් ඒ ඒ කුල අනුව වෙන් වෙන්ව වගා කර සිසුන්ට ස්වයං අධ්‍යයනය සඳහා ඉඩ සලසා ඇත.

මීට අමතරව උණ, මඩු, හණ, කළුවර, වැටකේ, කේතුධර, ජලජ, ඔසු, මීවණ, තෘණ වර්ග හා භෝග වන ද්‍රව්‍ය වැනි එකතූන් රාශියකට උද්භිද උද්‍යානය හිමිකම් දක්වයි.

මේ අනුව පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය හුදෙක් නරඹන්නන්ගේ විනෝදාස්වාදය සඳහාම පමණක් වුවක් නොවන බවත්, එහි විද්‍යාත්මක කාර්යභාරය වන විතැන් සංරක්ෂණ කාර්ය භාරය මේ අනුව පාඨක ජනතාව අතර පැහැදිලි වන බවත් මාගේ හැඟීමයි. එබැවින් උද්‍යානයේ අධ්‍යාපනික වටිනාකම වටහා ගෙන එය පරිහරණය කිරීමට සැමට ආරාධනා කරමු.



බෝ කළ Alphonsea hortensis පැළ



ශාක ගවේශණයේදී පැළ උද්‍යානයට ගෙන ඒම සඳහා ක්ෂේත්‍රයේදීම සූදානම් කිරීම